www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ පලාත් සභා මැතිවරනයේදී ඡන්දයෙන් වැලකී සිටීමේ ඉහල අනුපාතයක්

## Huge abstention rate in Sri Lankan provincial council elections

**විජේ ඩයස් විසිනි**
**2004 ජුලි 14**

ශ්‍රී ලංකාවේ පලාත් සභා අටකින් හයක් සඳහා ජුලි 10 දා පැවති මැතිවරනය මුලුමහත් දේශපාලන සංස්ථාපිතයෙන් ම ඡන්ද දායකයාගේ වියෝවීමක් පෙන්නුම් කරයි. ඡන්දය ප්‍රකාශකරන සාමාන්‍ය ප්‍රතිශතය වන සියයට 75-80ට වඩා ප්‍රකාශිත ඡන්ද ප්‍රතිශතය පහල වැටුනු අතර එය සියයට 55ක් විය. මෙය 1948 නිදහසින් පසුව ප්‍රකාශිත අඩුම සංඛ්‍යාව ය. යන්තම් තෙමසකට පෙර අප්‍රේල් 2 දා පැවති පාර්ලිමේන්තු මැතිවරනයේදී ඡන්දය දීමට සුදුසුකම් ලැබූ ලියාපදිංචි සංඛ්‍යාවෙන් ප්‍රකාශිත ඡන්ද ප්‍රතිශතය සියයට 76ක් විය.

ඡන්ද දායකයාගේ අඩු සහභාගිත්වය කිසිදු ප්‍රධාන පක්ෂයකින් කැඳවුම් කරන ලද ඡන්ද වර්ජනයක ප්‍රතිඵලයක් නො වී ය. ඇත්ත වසයෙන් ම සිදු වූයේ ඡන්දය භාවිතා කරන ලෙසට පක්ෂ හා මාධ්‍ය මගින් මහජනයා පෙලඹවීම යි.

මැතිවරනය දා *ඩේලි මිරර්* කතුවැකිය ''ඡන්ද මධ්‍යස්ථාන වෙතට ලගාවී රටේ අභිවෘද්ධිය තකා තමන් ගේ මනාපය සලකුනු කරන'' ලෙසට ඡන්ද දායකයන්ට අභියාචනයක් කර තිබුනි. එසේ නොවුන හොත්, ''මෙම වියදම් සහගත අභ්‍යාසයේ අවසන් ප්‍රතිඵලය ගුනාත්මක භාවයෙන් තොර අර්ථ විරහිත දෙයක් වනු ඇතැයි'' එය අඳෝනා නැගී ය.

අඩකට වැඩි ඡන්ද දායකයන් පාලක එක්සත් ජනතා නිදහස් සන්ධානය (එජනිස) සහ එක්සත් ජාතික පෙරමුන (එජාපෙ) විපක්ෂය යන දෙක ම කෙරෙහි පැතිර පවතින පිලිකුල පෙන්නුම් කරමින් මෙම ආයාචනයන් නොතකා හැරියහ. රටේ මනෝභාවයන් සලකුනු කරන්නේ දිගින් දිගටම පිරිහෙමින් පවතින ජීවන තත්වයන් හා රටේ දිග්ගැස්සුන සිවිල් යුද්ධය තාවකාලිකව අත් හිටවූ සටන් විරාමයේ අනාගතය පිලිබඳ අවිනිශ්චිත භාවය යි.

එජනිසය පලාත් සභා සියල්ලෙහි ම බහුතරය දිනා ගනිමින් ඡන්දය ජය ගත්තේ ය. එහෙත් ඡන්දයෙන් වැලකී සිටීමේ ඉහල අනුපාතිකයෙහි අර්ථය වනුයේ එහි ඡන්ද පදනම අප්‍රේල්වලදී ට වඩා බෙහෙවින් පහල වැටී ඇති බවයි. මුලු ඡන්ද දායකයන්ගෙන් එජනිසය ලබා ගත් ඡන්ද ප්‍රතිශතය සියයට 28කි. යන්තම් තෙමසකට ඉහතදී එය ලබා ගත් සියයට 45.6 වඩා පහල වැටීමකි. පසු ගිය සෙනසුරාදා වනවිට එජනිසය මුලු ඡන්ද සංඛ්‍යාව දසලක්ෂ 1.35කින් කඩා වැටුනු අතර එය දසලක්ෂ 2.87ක් බවට පත්විය.

ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංගගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) හා තවත් කුඩා පක්ෂ ගනනාවක සභාගයක් වන එජනිසය ඡන්දදායකයින් දිනාගැනීමට පොරොන්දු මාලාවක් දෙමින් අප්‍රේල් මැතිවරනය දිනා ගත්තේ ය. රැකියා විරහිත උපාධිධාරීන් දසදහස් ගනනකට රැකියා සැපයීම, රජයේ සේවකයන්ගේ වැටුප් සියයට 70කින් ඉහල දැමීම, පොහොර මිල අඩු කිරීම සහ අනෙකුත් සහනයන් ගනනාවක් මීට අඩංගු විය. පොරොන්දු වූයේ බලයට පැමින තෙමසක් ඇතුලත මේ සියල්ල ඉටු කරන බවට ය.

යූරියා පොහොර සඳහා මිල සහනාධාරය යලි ඇති කිරීම හැර අන් කිසිදු පොරොන්දුවක් ඉටු නො වීය. මෙම පියවරින් සුලු ගොවීන්ගේ අඩමාන වූ මූල්‍ය තත්වය ශ්ලේෂ මාත්‍රයකින් ඉහල ගියා පමනය. ග්‍රාමීය ප්‍රදේශවල පවතින මහජන කෝපය ඉවවැටුනු කෘෂිකර්ම ඇමති අනුර කුමාර දිසානායක ඡන්දයට දින තුනක් තිබිය දී පොහොර මත පනවා ඇති සියයට 15ක වටිනාකමට එක් කල බද්ද (වැට්) ඉවත් කරන බව නිවේදනය කලේ ය.

ඉහල යන බඩු මිල ජීවන තත්වයන් කඩා වැටීමට තුඩු දී ඇත. කොලඹ පාරිභෝගික මිල දර්ශකය මැයි-අප්‍රේල් මාසයේ ඒකක 45කින් ද මැයි මාසයේ ඒකක 129.6කින් ද ජූනි මාසයේ ඒකක 76.4කින් ද ඉහල නැංගේ ය. එජනිසය ආන්ඩුව මූන බේරාගැනීම සඳහා මිල ඉහල යාම එජාපෙ විපක්ෂයට හා සහල් වෙලඳුන් අතර කුමන්ත්‍රනයක් ලෙස හඳුන්වමින් එය දෝෂ දර්ශනයට ලක් කලේ ය.

සටන් විරාම ගිවිසුමේ අනාගතය පිලිබඳව ද ඇත්තේ බලාපොරොත්තු සුන්වීම හා කනස්සල්ලකි. අප්‍රේල් මැතිවරනයෙන් පසුව කුමාරතුංග දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය සමග සාකච්ඡා යලි ඇරඹීමට වෑයම් කලත් එය එජනිසය ඇතුලතම තියුනු විසංවාදයන්ට දොර විවෘතකර ලී ය. ඊනියා සාම ක්‍රියාවලිය අන්තරායකාරී වංක ගිරියක හිරවී තිබේ. තම සාමාජිකයන් මරා දැමීමට තමන්ගෙන් කැඩීගිය කන්ඩායමක් යොදා ගැනීම සම්බන්ධයෙන් හමුදාවට චෝදනා එල්ල කරමින් එල්ටීටීඊය යලි සටන් ඇවිලීම පිලිබඳව අනතුරු අඟවා තිබේ.

මේතාක් පැවති ආණ්ඩුවලට වැඩකරන ජනතාවගේ අපේක්ෂාවන් මෙතෙක් ඉටුකිරීමට නොහැකි වීම පාර්ලිමේන්තු ආයතනයන්ගෙන් පරත්වාරෝපනය වීමට මුල් වී තිබේ. ඡන්දය දීමේ පහල මට්ටම පිලිබඳව *අයිලන්ඩ්* පත්‍රයේ කතුවැකියක සඳහන් වූයේ, ''මහජනයා අපගේ දේශපාලනඥයන් පිලිබඳව ද පාර්ලිමේන්තු සභා ගැබ තුල ඔවුන්ගේ සාහසික හා අශෝභන ජාතිය අවමානයට පත්කලාවූ හැසිරීම් පිලිබඳව ද සත්තකින් ම පිලිකුල් සහගතව සිටී: අනෙක් හේතුව පලාත් සභා මහජන මුදල් කන්දරාවක් ගිල දමන එහෙත් කිසිවක් ඉටු නොකරන පරපෝෂිතයන් වීම නිසා විය හැකි ය.''

කුමාරතුංග සහ ඇගේ සගයන් ඡන්දයෙන් වැලකීමේ ඉහල අනුපාතය මුලුමනින් ම නොතකා හැරිය අතර පලාත් සභා මැතිවරනයෙන් විශිෂ්ඨ ජයග්‍රහනයක් ලබා ගත් බව කියා පාති. ''ජනතාව අප වෙත තැබූ විශ්වාසය මම ඉහලින් ම අගය කරන අතර එය සියලු කල්හිම නොකෙලසා ආරක්ෂා කරන බවට සහතික වෙමි. විකෘති කරන ලද මැතිවරන ක්‍රමය යටතේ පාර්ලිමේන්තුවේ බල තුලනය කවරක් වුව ද ඉමහත් වූ ජන වරම සත්‍ය වසයෙන් ම එක්සත් ජනතා නිදහස් සන්ධානය සඳහා වන බව මේ මැතිවරනය පැහැදිලිව ඔප්පු කලේ ය.'' යයි ඇය නිල නිවේදනයකින් ප්‍රකාශ කලා ය.

මුලු ඡන්දයෙන් තුනෙන් පංගුවට ද අඩු පදනම ''ඉමහත් ජන වරමක්'' ලෙස හඳුන්වන කුමාරතුංගගේ විකාර ප්‍රකාශය ඇගේ පාලනය ප්‍රජාතන්ත්‍රවාදී නොවන ස්වභාවය ආවරනය කර ගැනීමේ උත්සාහයකි. පාර්ලිමේන්තු බහුතරයක් තිබීම නොසලකා තේරී පත්වූ එජාපෙ ආණ්ඩුව පසු ගිය පෙබරවාරියේ දී ඇය විසින් නෙරපනු ලැබී ය. ඇයගේ එජනිසය අප්‍රේල් ඡන්දයේ දී බහුතරයක් දිනාගැනීමට අපොහොසත් වූ අතර අස්ථාවර පාර්ලිමේන්තු සුලුතරයක මත රැඳී සිටී.

කුමාරතුංග පාර්ලිමේන්තු සම්ප්‍රදායන් සහ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන් දිගින් දිගටම විවෘත අවඥාවට ලක් කරමින් සිටී. ඇය ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය, සම්ප්‍රදායිකව එය කරන පාර්ලිමේන්තුව තුල නොව ජාතික රූපවාහිනිය ඔස්සේ ප්‍රකාශයට පත් කලේ එය යම් විවාදයකට හෝ ඡන්දයකට භාජන වීම වැලැක්වීම සඳහා ය. පසු ගිය තෙමස තුල පාර්ලිමේන්තුව රැස් වූයේ සිව්වරක් පමන කි: මෙය මසකට 7-10 අතර දින ගනනක් පාර්ලිමේන්තුව පැවැත්විය යුතුය යන නීතිමය අවශ්‍යතාවය උල්ලංඝනය කිරීමකි.

එජනිසය ව්‍යවස්ථා වෙනසක් සඳහා දැන් යලි සැලසුම් කරමින් සිටියි. මෙම සංශෝධනයන්ගේ එක් ප්‍රමුඛ අරමුනක් වනුයේ කුමාරතුංග ආණ්ඩුවේ නායකයා ලෙස දිගටම සිටීම තහවුරු කිරීම ය. වර්තමාන ව්‍යවස්ථාව ජනාධිපතිවරයකුට ඉඩ සලසන්නේ දෙවරකට පමනක් වන අතර දෙවන නිල කාලයේ අවසානයට ඇය ලඟාවෙමින් සිටී. විධායක ජනාධිපති ධුරය අහෝසි කර පාර්ලිමේන්තු ක්‍රමයට යලි පිවිසීමේ ප්‍රෝඩාව යටතේ ඇය අගමැති ධුරය ලබා ගැනීමට සූදානම් වෙයි.

''ජන වරමක්'' පිලිබඳ ජනාධිපතිනියගේ කියා පෑම ව්‍යවස්ථා සංශෝධන ක්‍රමවේදයේ ව්‍යවස්ථා විරෝධී ස්වභාවය වසං කිරීම සඳහා වූවකි. කෙසේ වෙතත් ඕනෑම සංශෝධනයකට ව්‍යවස්ථාව අනුව පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයක් අවශ්‍යය ය. තුනෙන් දෙකේ බහුතරය කෙසේ වෙතත් කුමාරතුංග හා ඇගේ එජනිසයට සරල බහුතරය වත් නැති වුව ද ඔවුහු පාර්ලිමේන්තුව ''ව්‍යවස්ථා සම්පාදක මන්ඩලයක්'' බවට පත් කර සංශෝධනයන් එතුලින් රිංගවා ගැනීමට සැලසුම් කරමින් සිටිති.

## එජාපෙ පරාජයන්

එජනිසය වෙත පල වූ විරුද්ධත්වය පලාත් සභා ඡන්දයේ දී එජාපෙට ප්‍රසාදය පලකිරීමක් බවට පරිවර්තනය වූයේ නැත. එජාපෙ ඡන්ද ප්‍රමානය අප්‍රේල් මාසයේ 2,930,894 සිට 1,091,653ක් දක්වා සියයට 37.25කින් පසු ගිය සෙනසුරාදා පහල බැස්සේ ය. පුවත්පත් සාකච්ඡාවකදී එජාපෙ සංවිධායක එස්.බී. දිසානායක සමග සිය සාමාජිකයන්ගෙන් සියයට 25ක් පමන ඡන්ද ව්‍යාපාරයේ දී පක්ෂයට ක්‍රියාකාරීව සහයෝගය නොදුන් බව පෙර දිනයේ දී පිලිගත්ත ද එසේ සිදු වූයේ ඇයි දැයි පැහැදිලි කිරීමට අසමත් විය.

බලය අහිමි වූ තැන් පටන් එජාපෙ, එජනිසයේ ප්‍රතිපත්තිවලට හෝ ඔවුන් දුන් පොරොන්දු ඉටු කිරීමට අසමත් වීම පිලිබඳව කිසිදු අභියෝගයක් එල්ල කිරීමට අසමත් විය. ජනාධිපති විසින් තමන්ව බලයෙන් පහකර තිබියදීම - එජාපෙ සුලුතර ආණ්ඩුව පෙරලා දැමීමට අදහස් නොකරන බව යලි යලිත් තරයේ කියා සිටියේ ය. ඔවුන්ගේ බෙලහීන කම පිලිබිඹු කරන්නේ රටේ ගැඹුරු වන දේශපාලන අස්ථාවරත්වය පිලිබඳව පාලක කවයන් තුල ඇති භීතිකාව යි.

ඡන්ද දායකයන්ගේ පැත්තෙන් ගත් කල, රැකියා විනාශ කලා වූ ද ජීවන තත්වයන් දැඩි ලෙස කපා හැරියා වූ ද පෞද්ගලීකරනය සහ ආණ්ඩුවේ සහනාධාර හා අත්‍යවශ්‍ය සේවා කප්පාදුව ඇතුලු ආර්ථික ප්‍රතිව්‍යුහකරන පියවර මාලාවකට එජාපෙ ආණ්ඩුව වගකිව යුතු ය. කෙටියෙන්ම කිවහොත් ජාතික මට්ටමේ වේවා පලාත් මට්ටමේ වේවා තවත් එජාපෙ පරිපාලනයකින් කිසියම් යහපතක් ගෙන ඒ යයි බොහෝ දෙනා විශ්වාස නොකරති.

ප්‍රගතියක් අත් කරගත් එකම පක්ෂය ලෙස පෙනී යන්නේ ජවිපෙ පමනි. එජනිසයේ කොටසක් ලෙස පෙනී සිටිමින් ඔවුන්ගේ අපේක්ෂකයන් වැඩි ඡන්ද ප්‍රමානයක් ආකර්ෂනය කරගත් අතර වැඩි ආසන ගනනක් ද දිනා ගත්හ. 1999 දී මෙම පලාත් සභා හයෙන් ලැබී තිබුනු ආසන 22කට ප්‍රතිරූපීව දැන් ජවිපෙට ආසන 71ක් ලැබී තිබේ. එජනිසය ට ලැබුන මුලු ආසන සංඛ්‍යාවෙන් තුනෙන් එකකට වැඩි සංඛ්‍යාවක් ඔවුන් දිනා ගත්හ. ආසනයක් දිනා ගැනීමට අපොහොසත් වූයේ ජවිපෙ අපේක්ෂකයන් දෙදෙනකු පමන ය.

මැතිවරන ප්‍රතිඵලය එජනිස ආන්ඩුව මුලුමනින්ම අනුමත කිරීමක් ලෙස ජවිපෙ උදම් ඇනීය. ‘‘මෙම පලාත් සභා මැතිවරනයේ දී ඡන්දය දීම පහල අගයක් ගැනීම ගැන කිසිවෙකුත් කනස්සලු විය යුතු නැත. විපක්ෂයේ යූඑන්පීය ත් එය වටා රැලිවී සිටින විවිධ කන්ඩායම් සහ මාධ්‍ය බල ඇනිත් මෙම ජනතා තීන්දුව ඉදිරියේ දන නැමිය යුතුව ඇතැයි ජවිපෙ ප්‍රකාශනයේ සඳහන් විය.

ජවිපෙ ප්‍රකාශයේ මෙසේ ද සඳහන් විය, ‘‘ඔවුන් මෙම තීන්දුව ස්වෙච්ඡාවෙන් පිලිගැනීමට සූදානම් නැතිනම් මේ රටේ දේශප්‍රේමී ජනතා බලවේග ඔවුන්ට මෙය බලහත්කාරයෙන් පිලිගැන්නවීමට ක්‍රියාකාරී ආරම්භයක් ගනු ඇත.’’ මෙම තර්ජනාත්මක අනතුරු ඇඟවීම හුදෙක් දක්ෂිනාංශික එජාපෙට පමනක් නොව ආන්ඩුවට එරෙහි ඕනෑම දේශපාලන විරුද්ධත්වයකට එල්ල කරනු ලැබූ, තුනී ලෙස ආවරනිත, ප්‍රචන්ඩත්වයේ තර්ජනයකි. ඉන්දු ලංකා ගිවිසුම මගින් රටේ සිවිල් යුද්ධය අවසන් කිරීමට දරන ලද ප්‍රයත්නයනට එරෙහිව ඔවුන්ගේ දේශප්‍රේමී ‘‘ව්‍යාපාරයට’’ එක්වීම ප්‍රතික්ෂේප කල සියගනනක් කම්කරුවන් සහ දේශපාලන විරුද්ධවාදීන් ජවිපෙ ඝාතක කල්ලි විසින් 1980 ගනන් අගභාගයේ දී මරා දැමූහ.

මැතිවරනයෙන් අනතුරුව එල්ටීටීඊය ට ද, උතුර සහ නැගෙනහිර සඳහා අන්තර් පරිපාලනයක් පිහිටුවීම මත සාකච්ඡා සඳහා එල්ටීටීඊය කල කැඳවුමට ද එරෙහිව රට පුරා පැතිරුන පෝස්ටර් ව්‍යාපාරයක් ජවිපෙ විසින් දියත් කලේ ය. එවන් පරිපාලනයක් වෙනම දෙමල ඊලම් රාජ්‍යයක් සඳහා වන එල්ටීටීඊයේ ඉල්ලීමට ඉඩ සැලසීමට සමාන වන බවට ජවිපෙ කුපිත ලෙස ප්‍රකාශ කලේ ය. එල්ටීටීඊයට කිසිදු සහනයක් නොදෙන තැනට කුමාරතුංගට බලකිරීම කිරීම අරමුනු කර ගත් මෙම විවෘත ස්වෝත්තමවාදී ව්‍යාපාරයට හැකිවන්නේ යුද්ධයට යලි අවතීර්න වීමේ අන්තරාය ඉහල නැංවීම පමනි.

© www.wsws.org